# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1705/9 - 2011 මැයි 10 වැනි අඟහරුවාදා - 2011.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට නුවරඑළිය දිස්ත්‍රික් සමූහ ජල සම්පාදන ව්‍යාපෘතියේ ගිනිගත්හේන ජල සම්පාදන ක්‍රමයේ වැඩ භාර නිලධාරී කාර්යාලයේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2011 අප්‍රේල් මස 27 වැනි දින,
අංක 35, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/925.

### උපලේඛනය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 315A ගිනිගත්හේන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගිනිගත්හේන ගමේ පිහිටි පවලමලේ වත්ත නැමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු පී. ඥානප්‍රකාසම් මහතා පිළියෙල කරන ලද අංක : 9815 දරන පිඹුරේ කැබලි අංක : 01 වශයෙන් දැක්වෙන පර්චස් 3.57 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මහා මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු ඉඩම සහ ප්‍රවේශ මාර්ගයේ කොටසක් ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | නිවාස වලට යන මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 01. කේ. කේ. චන්ද්‍රදාස මහතා,
චන්දන, බණ්ඩාරනායක මාවත,
ගිනිගත්හේන.

05-566